සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/07/SD/ 2016
ඔබේ අංකය / உமது இல / Your No: ........................................
දිනය / திகதி / Date: 2016.05.13

දිවිනැගුම චක්‍ර ලේඛ අංක 2016/6

සියලුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**දිවිනැගුම සමාජ සංවර්ධන වැඩසටහන - 2016**

දිවිනැගුම සංවර්ධන වැඩසටහනට අනුගත වෙමින් අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන මට්ටම සමාජීය වශයෙන් ඉහළ නැංවීම හා සාරධර්ම වලින් පිරි යහපත් සමාජයක් නිර්මාණය කිරීම උදෙසා නව දැක්මක් යටතේ සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මෙම වර්ෂයේ දී අපේක්ෂා කෙරේ.

02. ඒ අනුව **ඇමුණුම් අංක 01** හි සඳහන් වන සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු අතර ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලට අමතරව සමාජ සංවර්ධන පදනම සතු අරමුදල් යොදවාගත යුතුවේ.

03. මෙම වැඩසටහන සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන දිස්ත්‍රික්ක සඳහා වෙන්වන ආකාරය **ඇමුණුම් අංක 02** හි සඳහන් වේ.

04. තව ද සමාජ සංවර්ධන පදනම යටතේ වෙන වෙනම වැඩසටහන් අනුමත කිරීමට ප්‍රධාන කාර්යාලයට එවීම අවශ්‍ය නොවන අතර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල අවශ්‍යතාවය අනුව **ඇමුණුම් අංක 03** හි සඳහන් සීමාවන් අනුව වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. මේ සඳහා සමාජ සංවර්ධන පදනමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පොදු උපදෙස් **ඇමුණුම් අංක 04** හි සඳහන් වේ.

05. මීට අදාල සියලු වැඩසටහන්වල ප්‍රගතිය **ඇමුණුම් අංක 05** ආකෘතිය අනුව සෑම මසකම 10 වන දිනට ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලෙස අදාල නිලධාරින් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

06. මේ චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය වුවහොත් 0112 -889005, 0112-876601 දුරකථන අංක මගින් හෝ socialdev@divineguma.gov.lk විද්‍යුත් තැපැල් ලිපිනය මගින් සමාජ සංවර්ධන අංශය අමතන්නේ නම් මැනවි.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General / 011-2873802/2872202 / Fax -011-2889002 / dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral / 011-2871672 / Fax -011-2871672 / adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர்(நிர்வாகம்) / Director (Administration) / 011-2873799 / Fax -011-2873996 / diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant / 011-2869742 / 011-2869742 / finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office / 011-2887280 / **011- 2887722(Hotline)**

07. මෙම චක්‍රලේඛ උපදෙස් මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අනිකුත් රෙගුලාසි ද අදාල කර ගනිමින් ක්‍රියාත්මක කළ යුතු වන අතර සමාජ සංවර්ධන වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා ඔබ ඇතුළු කාර්ය මණ්ඩලය දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

චන්ද්‍රා වික්‍රමසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: -

01. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමා - කා.දැ.ගැ.ස.

02. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු නියෝජ්‍ය අමාත්‍ය රන්ජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.ස.

03. ලේකම් , සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.

04. අතිරේක ලේකම්(දිවිනැගුම), සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.

05. විගණන අධිකාරි, රජයේ විගණන අංශය, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.

06. ප්‍රධාන ගණකාධිකාරි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.

07. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.

08. සියලුම අංශ ප්‍රධානීන්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.